# ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව - 2011

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් අපහරණයක් සිදු නොවූවද, වත්කම් අපහරණ ලෙස රු.1,929,239 ක් ප්‍රත්‍යාගණන සංචිතයට ගැලපීම් කර තිබුණි.

(ආ) වියදමට අදාළ කාර්යයන් ඉටු කර නොමැතිව තිබියදී ඒ සඳහා රු.2,470,000 ක් විවිධ වෙන් කිරීම් යටතේ වියදම් ගිණුම් හර කිරීම හේතුවෙන්, වර්ෂයේ අතිරික්තය රු. 2,470,000 කින් අඩුවෙන් දැක්වේ.

#### 1.2.2 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) මු.රෙ.845(1) හි 26 වන පරිශිෂ්ඨය | 2011 වර්ෂය සඳහා දුරකථන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි මස 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛය 8.3.4 ඡේදය | නිලධාරීන්ගේ මාසික දුරකථන බිල් සීමාව තීරණය කිරීමට කටයුතු කිරීමකින් තොරව කාර්යාලයීය දුරකථන බිල් සියල්ල එකම බිල්පතකින් ගෙවා තිබුණි. |
| (ඇ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 වගන්තිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛයේ 8.7 ඡේදය | උපයන විට ගෙවීමේ බදු අදාල සේවකයින් විසින් ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදි රු.456,676 ක් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2005 දෙසැම්බර් 19 දිනැති පීඊඩී අංක 33 දරන චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් රු.49,999,955 ක් රාජ්‍ය බැංකුවල ආයෝජනය කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ අරමුදල් මෙහෙයුම්වලින් රු.55,517,633 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.20,725,564 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු.34,792,069 ක වර්ධනයක් දක්නට ලැබුණි. මෙම වර්ධනය පහත දැක්වෙන පරිදි විග්‍රහ කළ හැක.

| | විචලනය | | |
|---|---|---|---|
| | හිතකර | අහිතකර | |
| | රු. | රු. | රු. |
| **ආදායම** | | | |
| විචල්‍ය ලියාපදිංචි ගාස්තුව | 7,111,457 | | |
| වාර්ෂික නියාමන ගාස්තුව | 43,136,500 | | |

| | | | |
|---|---|---|---|
| බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තුව | - | 220,000 | |
| වෙනත් ආදායම් | 1,853,893 | - | |
| | ------------- | ------------ | |
| | 52,101,850 | 220,000 | 51,881,850 |
| | ======== | ======= | |
| **වියදම්** | | | |
| --------- | | | |
| පුද්ගල පඩිනඩි | | 8,259,647 | |
| විශ්‍රාමික ප්‍රතිපාදන | | 919,750 | |
| දේශීය විදේශීය ගමන් වියදම් | | 8,576,253 | |
| පරිභෝජන ද්‍රව්‍ය | 37,831 | | |
| ගිවිසුම්ගත සේවා | 1,434,745 | | |
| වෙනත් සේවා | 954,661 | | |
| ප්‍රාග්ධන වත්කම් නඩත්තුව හා අළුත්වැඩියාව | 4,750 | | |
| මූල්‍ය පිරිවැය | | 4,850 | |
| හඳුනා ගත් අලාභ | | 291,856 | |
| ක්ෂය ප්‍රතිපාදන | | 1,590,180 | |
| පාරිතෝෂික වෙන් කිරීම | 21,022 | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | 99,746 | | |
| | ------------- | ------------- | |
| | 2,552,755 | 19,642,536 | 17,089,781 |
| | | | --------------- |
| මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීම | | | 34,792,069 |
| | | | ======== |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

කොමිෂන් සභාවේ 2011 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 14(2)(1) වගන්තිය යටතේ වූ විදුලිය, ජලය හා ඛනිජ තෙල් කර්මාන්ත සම්බන්ධයෙන් නියාමන ලෙස කටයුතු කිරීම සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පුනරාවර්තන වියදම් ලෙස රු.245,034,205 ක් හා ප්‍රාගධන වියදම් ලෙස රු.45,474,980 ක් වැය කර

තිබුණද, 2009 අංක 23 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුල කර්මාන්තයේ නියාමන කටයුතු 2009 අප්‍රේල් 08 දින සිට කොමිෂන් සභාව ඉටු කරනු ලබන අතර, ජලය හා ඛනිජ තෙල් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල පනත් සංශෝධන අනුමත නොවීම නිසා එම කර්මාන්තවල නියාමන කටයුතු ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2009 අංක 23 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 9 වගන්තිය ප්‍රකාරව රජයේ කොටස් ප්‍රාග්ධනය 50% ක් නැති සහ මෙ.වො. 25 ට වැඩි ධාරිතාවකින් විදුලිය උත්පාදනය කරන සමාගම්වලට විදුලිය උත්පාදනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැක. ඒ අනුව දැනටමත් ධාරිතාවය මෙ.වො. 25 ඉක්මවා විදුලිය උත්පාදනය කරන සමාගම් 06 කට බලපත්‍ර නිකුත් කර නොතිබණද, එම සමාගම් විසින් උත්පාදනය කරනු ලබන විදුලිය ශ්‍රී ලංකාවේ විදුලි බල ධාරිතාවයට එක් කර ගෙන තිබිණි. එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලිහිසි තෙල් වෙළඳ පොළේ කටයුතු කරනු ලබන සමාගම් වල වාර්ෂික මුළු විකුණුම් වලින් 0.5%ක් ගණනය කල විට එම වටිනාකම රුපියල් මිලියනය ඉක්මවන්නේ නම් පමණක් එම ඉක්මවන ප්‍රමාණය කොමිෂන් සභාවේ විචල්‍ය ලියාපදිංචි ගාස්තු ලෙස අයකර ගත යුතුය. ඒ අනුව, 2011 වර්ෂය අවසාන වන විට ලිහිසි තෙල් වෙළඳ පොල කටයුතු කරනු ලබන සමාගම් 14 ක් කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණද එම සමාගම් 14 න් මුළු විකුණුම් අනුව රුපියල් මිලියනය ඉක්මවා තිබුණේ සමාගම් 8 ක පමණි. එම සමාගම් 8 න් සමාලෝචිත වර්ෂය සඳහා රු. 25,225,485 ක විචල්‍ය ලියාපදිංචි ගාස්තු ලෙස ලැබී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

(අ) 2009 දෙසැම්බර් 31 දිනට පොතවලින් ඉවත් කරන ලද අයිතම 10 ක් යටතේ දක්වා ඇති පිරිවැය රු.1,324,436 ක් වූ හා 2010 දෙසැම්බර් 31 දිනට පොත්වලින් ඉවත් කරන ලද අයිතම 7 ක් යටතේ දක්වා ඇති පිරිවැය රු.83,344 ක් වූ ලී බඩු හා සවි කිරීම් නිසි පරිදි බැහැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ලිහිසි තෙල් ව්‍යාපාරයේ නියුතු ආයතනවල විකුණුම් වටිනාකම් මත විචල්‍ය ලියාපදිංචි ගාස්තු ගෙවීමට අවශ්‍යව පවතීද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ආයතන දෙකකින් විස්තර ගෙන්වා ගැනීමට හෝ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

කොමිෂන් සභාව විසින් 2011 වර්ෂය තුළදී සේවක භාරකාර අරමුදලට ගෙවූ අධිභාර රු.5,991 ක් ද, සේවක වන්දි රු.284,000 ක් ද, වෙනත් පාඩු රු.1,699 ක් ද වශයෙන් එකතුව රු.291,690 ක අනාර්ථික වියදමක් දරා තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි මස 02 දිනැති පීඊඩී 12 චක්‍රලේඛයට අනුව විගණන හා කළමනාකරණ කමිටු පත්කර නොතිබුණි.

4.2 අයවැය ලේඛණය

------------------

අයවැයගත වියදම් සත්‍ය වියදම් අතර 0% සිට 175% දක්වා විචලනයක් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛණය ඵලදායි මුල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව, පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම

(ආ) විගණන හා කළමනාකරණ කමිටු

(ඇ) ආයෝජන